**මහනුවර දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 45 - 2023**

**------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 45 හි එක් කාරක සභාවකට අහිතකර මතයක් ද කාරක සභා 03 ක මතය ව්‍යාවනය කිරීමද කාරක සභා 41 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ද ප්‍රකාශ කර ඇති අතර, මේ සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) වගන්තිය පරිදි යන්ත්‍රෝපකරණ හා ගොඩනැගිලි ගත් මිල මත ක්ෂය කළ යුතු වූවත් ගොවිජන සේවා කාරක සභා 17ක් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරිමේ දී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණු ගොවිජන සේවා කාරක සභා 42 ක් විය. | මූල්‍ය ප්‍රකාශන දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් සහ ලබා දී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කර ඇති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේ හදබිම අධිකාරියට පවරා දී තිබූ රු.250,112 ක දැල්පිටිය ගොවිජන සේවා කාරක සභාවට අයත් කුබෝටා ට්‍රැක්ටරයක වටිනාකමත් 2015 වර්ෂයේ | පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය උපදෙස් ඉල්ලා නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා ඇති බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉඹුල්දෙණිය ගොවිජන සේවා කාරක සභාව විසින් අපහරණය කර තිබූ ට්‍රැක්ටරයක් වෙනුවෙන් කොමසාරිස්වරයාට ගෙවිය යුතු රු.479,000 ක වටිනාකමක් නිරවුල් කිරීමෙන් තොරව තව දුරටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 06 ක් කොන්ත්‍රාත් මත ලැබුණු සියයට 1 ක රැඳවුම් මුදල් රු.421,079 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර කාරක සභා 02 ක් ඉකුත් වර්ෂවලට අදාළ රැඳවුම් මුදල් රු.664,758 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් 2024 වර්ෂයේ දි මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට හා කාරක සභා අරමුදලට බලපෑම නිවැරදි කරන බව හා වර්ෂයට අදාළ වටිනාකම පමණක් ගිණුම්ගත කරන බව ඉල්ලා නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා ඇති බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 09 ක ඉදිකිරීම් ඒකක ගොඩනැගිලි, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ, කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර යනාදී වත්කම් විෂයයන් 123 ක වටිනාකම හඳුනාගෙන දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාලයෙන් විමසා වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ගොවිජන බැංකු ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනීමට එකක් රු.17,131 ක් බැගින් ගොවිජන සේවා කාරක සභා 29ක් සඳහා රු.496,799 ක් හා එකක්රු.62,100 බැගින් ප්‍රින්ටරයක් මිලදී ගැනීමට ගොවිජන සේවා කාරක සභා 24 ක් සඳහා රු.1,490,400 ක් ලෙස එකතුව රු.1,987,199 ක ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ට ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම උපකරණ කාරක සභා වෙත ලැබී නොතිබුණ ද එම ගෙවීම් අත්තිකාරමක් ලෙස ගිණුම්ගත නොකර වියදමක් ලෙස හා ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දි නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 24 ක ගෙවිය යුතු විගණන ගාස්තු රු.1,316,408 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ඒ සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | කරුණු සොයා බලා නිවැරදි කිරිමට හා ගෙවිමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට හා හිඟ විගණන ගාස්තු ගෙවිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගොවිජන බැංකුව සඳහා Scanner යන්ත්‍රයක් සහ Dot Matrix Printer 02 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයකින් රු.223,336 ක් බැගින් ගොවිජන සේවා කාරක සභා 38 කින් රු.8,486,768 ක මුදලක් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ගෙවා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටද එම යන්ත්‍ර කාරක සභාවන් වෙත ලැබී නොතිබුණද ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එක් උපකරණයක් මේ වනවිට ලැබී ඇති අතර අනෙක් උපකරණ දෙක ගිණුම් ගත කළ යුතු ආකාරය පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | නිවැරදිව කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) | 2023 අප්‍රේල් 24 දිනැති අංක 01/2023 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1.1 වගන්තිය ප්‍රකාරව එක් එක් ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ වාර්ෂික අවසන් ගිණුම් වාර්තාව අනුව ශුද්ධ උපලබ්ධි ලාභයෙන් සියයට 10 ක් ණය අවදානම් සඳහා ගොවි ආපදා ණය ආවරණ ගිණුමට වෙන් කිරීම වාර්ෂිකව සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 8 ක එලෙස වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | 2024 සිට ශුද්ධ උපලබ්ධි ලාභයෙන් සියයට 10 ක් වෙන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගොවි බැංකු 28 ක් සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.2,975,859 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කරන බව. | කාල පරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 18 ක ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් විෂයයන් ඇතුළු ගිණුම් විෂයයන් 57 කට අදාළව මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා ඇති ශේෂයන් උපයෝගී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.6,562,953 ක වෙනසක් ද ගොවිජන සේවා කාරක සභා 02 ක ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අවසන් ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු.621,571 ක වෙනසක් ද පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 11 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වසර ගණනාවක සිට පවතින රු.54,980,773 ක හර ශේෂයක් හා රු.765,194 ක බැර ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | වෙනස හඳුනාගෙන නිරවුල් කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 37 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.39,366,692 ක වත්කම් විෂයයන් 343 ක හා එකතුව රු.20,837,627 ක වගකීම් විෂයයන් 318 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, ශේෂ තහවුරු කිරීම්, ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | පෙර සිට ගිණුම් වාර්තාවල පැවත එන ශේෂ පවතින බවත් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර අනිකුත් ශේෂ සනාථ කිරීම් ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන පවත්වාගත යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 880 හා 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 29 ක විධායක ලේකම්, ගොවිජන බැංකු ලිපිකරු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණි. | ඉදිරියේ දී ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 891 | ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් සේවක ඇප පිළිබද ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේ දී ඇප ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 08/2009 හා 2009 ජූනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 33ක නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | අක්‍රීයව ඇති ඇඟිලි සළකුණු යන්ත්‍ර අලුත් වැඩියා සඳහා නියෝජ්‍ය කොමසාරිස්ගෙන් උපදෙස් පතා ලිපි යවා ඇති බවත්, ක්‍රියාත්මක තත්වයේ පවතින ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් පැමිණීම පිටවීම සටහන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කොමසාරිස් චක්‍රලේඛ | | | |
| i | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | අදාළ වර්ෂය තුළ කාමර කුලී අයකරගැනීමට කටයුතු කළ යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 11 ක් සමාලෝචිත වර්ෂය අවසානයට රු.672,480 ක කාමර කුලී අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අදාළ කාමර කුලී 2024 වර්ෂයේ අයකර ගෙන ඇති බවත් පැරණි ශේෂ කපා හැරීමට නියෝජ්‍ය කොමසාරිස්තුමාගෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර කාමර කුලී අයකරගත යුතුය. |
| ii | 2016 පෙබරවාරි 09 දිනැති අංක 03/2016 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 09 ක අදාළ බල ප්‍රදේශය තුල ලියාපදිංචි ගොවි සංවිධාන 264 න් ගොවිසංවිධාන 192 ක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා විසින් හා ගොවි සංවිධාන 237 ක් විධායක නිලධාරී විසින් පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේ දී පරික්ෂණ ආකෘතිය ප්‍රකාරව ගොවි සංවිධාන පරික්ෂා කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| iii | 1988 මැයි 27 දිනැති අංක 322 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 07 ක රු.177,675 ක ඉඩම් හිමි ප්‍රවේණි මුදල් සම්බන්ධයෙන් චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලැබුණු පසු ගොවිජන සංවර්ධන අරමුදලට බැර කිරිමට කටයුතු කරන බව. | නියමිත පරිදි ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 15 ක් මිල කැඳවීමකින් තොරව රු.14,766,729 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි. | හදිසි මිලදී ගැනීම් සඳහා කාරක සභා අනුමැති ලබාගෙන ඇති බවද උපදෙස් දී ඇති පරිදි ඉදිරියේ දී මිල ගණන් කැඳවීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 38 ක එකතුව රු.12,646,056 ක අතිරික්තයක් හා කාරක සභා 07 ක එකතුව රු.859,856 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.12,534,437 ක් හා රු.827,559 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 45හි එකතුව රු.19,822,601ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,522,278 ක් විය .

**2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය**

කාරක සභා 45 අතරින් කාරක සභා 26 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයේ හි රු.7,618,361 වර්ධනයක් ද කාරක සභා 19 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,541,041 ක පිරිහිමක් ද නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට මූල්‍ය හා වෙනත් වියදම් අඩු වීම, අක්කර බදු ආදායම්, වෙනත් ආදායම් හා ගාස්තු ලැබීම් ඉහල යාම, ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහිමට කොන්ත්‍රාත්දායක ආදායම අඩුවීම, මධ්‍යස්ථාන නඩත්තු හා පරිපාලන වියදම් ඉහළ යාම, කුලී ආදායම්, කෘෂි උපකරණ අලෙවි ආදායම්, ගොවි සංවිධාන පරිත්‍යාග අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 32 ක් ඒවා පිහිටි ඉඩම්වල අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 3ක 2022 දෙසැම්බර් 21 දිනැති අංක 7/5/3 - වි.මු.ගෙ දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපියේ,4 (vi) අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් අය විය යුතු එකතුව රු.426,985 ක් මේ දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මැදමහනුවර සහ ගම්පොළ යන ගොවිජන සේවා මධ්‍යස්ථාන 2 හි අලෙවිහල් 3ක් බදු දී තිබුණ ද ඒ සඳහා ගිවිසුමක් හෝ ලිඛිත ලියවිල්ලක් අත්සන් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | බදු ගිවිසුම් අත්සන් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 13 ක සමාලෝචිත වර්ෂයේ අවසාන තොගයේ පැවති එකතු වටිනාකම රු.265,170 ක් වූ තොග ද, එකතු වටිනාකම රු.33,112 ක් වූ පැළ තොග ද, එකතු වටිනාකම රු.239,199 ක් වූ කෘෂි රසායන තොග ද, එකතු වටිනාකම රු.91,387 ක් වූ පොහොර තොග හා එකතු වටිනාකම රු.8,811 ක් වූ කල් ඉකුත් වූ පැවතිය ද මෙම තොග සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 08 දිනැති අංක 2006/08 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව විධිමත් පරිදි පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | තොග පොත් වලින් කපා හැරීම සඳහා කාරක සභා අනුමැතියෙන් පසු ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට යොමු කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 35 ක වසම් 796 කට අයත් කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 28854 ක් වූ අතර ඉන් 2023 යල කන්නයේ වගා නොකළ කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 17196 ක්ද 2023/24 මහ කන්නයේ වගා නොකළ ඉඩම් ප්‍රමාණය අක්කර 14,615 ක් විය | සියළු ඉඩම්වල වී වගාව සිදු නොකළද එළවළු, කන්න බෝග වගා කර ඇති බව. | කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 31 ක 2023 වර්ෂය අවසාන වන විට පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 1581 ක් විය. | වගා නොකරන ලද කෘෂිකාර්මික ඉඩම් වගා කරවීමට කටයුතු කරන බව. | වගා නොකරන කුඹුරු ඉඩම් සම්බන්ධව නීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 18 ක් 2018 දෙසැම්බර් 31 දිනැති අංක 07/05/12/ගි.වා/තා.ගො දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපියේ උපදෙස් අනුව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව පැවත එන එකතුව රු.12,728,252 ක වත්කම් විෂයන් 190 ක් හා එකතුව රු.10,160,288 ක වගකීම් විෂයයන් 180 ක් නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 අගෝස්තු 21 දිනැති අංක SMFI/3/D/08/08 දරන කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය අනුව පොහොර සහනාධාර ලබා දීමට සුදුසු ගොවීන්ගේ නම් අදාළ තොරතුරු සමඟ Agrarian.lk වෙබ් අඩවියට ඇතුළත් කළ යුතු අතර, ඒ අනුව ගොවිජන සේවා කාරක සභා 11 විසින් 2023/24 මහ කන්නයේ වී වගා කරන ලද ගොවීන් 10964 දෙනෙකුගේ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර තිබුණි. ඉන් ගොවීන් 9084 දෙනෙකුට සහනාධාර මුදල් ලැබී තිබුණු අතර ඒ අනුව මහ කන්නය සඳහා සහනාධාර ලැබිය යුතු ගොවීන් 1875 දෙනෙකුට තවදුරටත් සහනාධාර මුදල් ලැබී නොතිබුණි. | ගොවීන් ලබා දුන් බැංකු ගිණුම් නිවැරදි නොවීම මත සමහර ගොවීන්ට සහනාධාර ලැබී නොමැති බවත් නැවත නිවැරදි කරන ලද බැංකු ගිණුම් විස්තර දිස්ත්‍රික් කාර්යාලයට දැනුම් දී ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව නියමිත කාලය තුළ සහනාධාර මුදල් ලබාදීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 3ක 1996 වර්ෂයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලද කොළ මඩින යන්ත්‍රයක්, ට්‍රැක්ටර් රථයක් හා මඩවීල් 2 ක් හා රු.172,600 ක් වටිනා සීසීටීවී කැමරා පද්ධතියක් හා රු.380,000 ක් වූ කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර 02 ක් හා කාරක සභා 5ක රජයේ නිවාසයක්, අලෙවිසැලක්, පැළ කුටි 3ක් ඌන උපයෝජිතව පැවතුණි. | සීසීටීවී කැමරා පද්ධතිය අලුත්වැඩියා කිරීමට දැනුවත් කර ඇති බව හා අනෙකුත් වත්කම් ඉදිරියේදී ඵලදායි ලෙස භාවිතා කරන බව | නිෂ්ක්‍රිය වත්කම් උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 පාඩු හා අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 5ක 1995 සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් කාරක සභාවලට අයවිය යුතුව තිබුණු රු.1,736,509 ක මුදලක් වගකිවයුත්තන් නිශ්චය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | ශේෂ අයකර ගැනීම සඳහා තොරතුරු දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කර ඇති බව | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 44 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවීන් 6784 දෙනෙකුට ලබා දී තිබුණු ණය මුදලින් එකතුව රු.188,083,364 ක හිඟ ණය ශේෂයක් ද රු.20,022,147 ක හිඟ ණය පොළියක්ද මාස 6 ත් වර්ෂ 24 ත් අතර කාලයක් කල් පසු වී ඇතත් අය කර ගෙන නොතිබුණි. | මේ වන විට එම ණය හා පොලී අය කර ගැනීම සඳහා විනිශ්වය සභාවට හා අධිකරණය වෙත අදාල ගොනු යොමු කර ඇති අතර එම මුදල අය වෙමින් පවතින බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 36 ක තැන්පතු ගිණුම් 214 ක කේවල ශේෂ ලැයිස්තු ඉදිරිපත් නොකිරීම මත සහ ඉදිරිපත් කල ඇතැම් ශේෂ ලැයිස්තු අසමාන වීම මත එකතුව රු.327,931,837 ක කේවල ශේෂවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | ඉදිරියේදී කේවල ශේෂ ලැයිස්තු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | තැන්පතුවලට අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 7 වන වගන්තිය හා 2021 ජුලි 15 දිනැති අංක 7/12/4/5 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ සංශෝධිත ලිපිය ප්‍රකාරව ගොවි බැංකුව විසින් වර්ෂයේ ලාභයෙන් ලාභාංශ වෙන් කළ යුතු යැයි දැක්වුවද සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 17 ක එලෙස වෙන් කිරීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ලාභාංශ වෙන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020 ජුනි 24 දිනැති අංක 09/2020 – 04/2012 (සංශෝධන I) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.8.6 ඡේදය අනුව ව්‍යාපෘති ණය සඳහා ධනයෝජන ගිණුම් ආරම්භ කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 15 ක ධනයෝජන ගිණුම් ආරම්භ කර නොතිබුණි. | ඉදිරියේ දි සෑම ව්‍යාපාති ණය කරුවකු සඳහාම ධනයෝජන ගිණුමක් ආරම්භ කිරිමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 අප්රේල් 24 දිනැති අංක 01/2023 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1.2 හා 2.2.2 වගන්ති අනුව ගොවීන් වෙත ණය නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ගොවි ආපදා ආවරණ ගිණුමට ගොවි බැංකු (නියමු) | 2024 වර්ෂයේ වෙන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ දායකත්වය වශයෙන් අදාළ ප්‍රතිශතයන්ගෙන් වෙන් කිරීම් සිදු කළ යුතු බවට දක්වා තිබුණද ගොවිජන සේවා කාරක සභා 18 ක එසේ සිදු කර නොතිබුණි. | | |
| (ඊ) | 2014 ජුලි 09 දිනැති අංක 05/2014 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව පෙරමග ළමා තැන්පත් ගිණුම්වල තැන්පතු ශේෂ වයස අවුරුදු 18 ඉක්ම වූ ගිණුම් හිමියන් සඳහා සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වලට මාරු කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 5 ක එලෙස කටයුතු කර නොතිබුණි. | සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වලට මාරු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.4.11 (i) ඡේදය ප්‍රකාරව ආපදා ණය ආවරණ ගිණුමට රැස්වෙන මුදල් රාජ්‍ය බැංකුවක වැඩි පොලී ලැබෙන ඉතිරි කිරීමේ ගිණුමක රඳවා තබා ගත යුතු වුවත්, එසේ වෙනම ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර නොතිබුණු ගොවිජන සේවා කාරක සභා 3 ක් පැවතිණි. | ඉතිරි කිරිමේ ගිණුමක් විවෘත කිරිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | වාවින්න සහ උල්පතගම ගොවි බැංකුවල එකතුව රු. 2,708,667 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයන් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (එ) | ගොවිජන බැංකු 06 ක සමාලෝචිත වර්ෂයට අදාළ රු.753,020 ක් වැඩියෙන් ද ගොවි බැංකු 12 ක් බැංකු පොලි ආදායම රු.2,463,756 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කරන බව. | කාල පරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | දිගන ගොවිජන සේවා කාරක සභාවේ වසර ගණනාවක සිට ගිණුම්වල පෙන්වන වටිනාකම රු.1,218,487 ක් වූ අයවිය යුතු ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | මේ වන විට රැකවරණ නිලධාරියෙකුගේ නම් කරන ලෙස ලිඛිතව දැනුම් දෙන ලද බව. | හේතු හඳුනාගෙන ශේෂ නිරවුල් කළ යුතුය. |